**මොරටුව විශ්වවිද්‍යාලය - 2021**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මතය**

**-----**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ විශ්වවිද්‍යාලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලවආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් සම්බන්ධීකරණය කරනු ලබන BIT පාඨමාලාව සඳහා පෞද්ගලික ආයතන සමග එළඹි ගිවිසුම්වලට අනුව එක් එක් ආයතනය විසින් බඳවා ගත යුතු අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා නොගැනීම හේතුවෙන් පෞද්ගලික ආයතන දෙකකින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතු එකතුව රු.8,255,000 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | එම ආයතනවලට දැනටමත් මොරටුව විශ්ව විද්‍යාලය විසින් ලිපි යවා ඇති අතර එම ගිවිසුමේ ප්‍රකාරව එය අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු සිදු කරමින් ඇත. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 සිට වර්ෂ 07 දක්වා කාලයක් ගතවී තිබුණු එකතුව රු.2,398,749 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණයහිමි ශේෂයන් සම්බන්ධයෙන් විස්තරාත්මකව සොයා බලා ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයි. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මුදල් රෙගුලාසි 760 (අ) | නඩත්තු අංශයේ පිරිවැය රු.793,088 ක් වූ භාණ්ඩ අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු නොකර අවසන් තොගයෙන්ද ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. | මෙම රු.793,088 ක් වූ අගය ලබාගැනීමේ දී සඳහන් වී ඇති ඒකක මිල ගණන් පවතින මිල ගණන් හා එකඟ නොවන බැවින් මෙම එකඟ විය නොහැකි ඒකක මිල ගණන්වල වටිනාකම මුළු අගයට ප්‍රමාණාත්මකව බලපාන බවද පෙනේ. | පිරිවැය නිවැරදිව හඳුනා ගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 571 (2) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ දින සිට වර්ෂ 02 ඉක්මවූ එකතු වටිනාකම රු.10,249,876 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල පාර්ශවයන් දැනුවත් කොට ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදුකිරීමටත්, විවිධ තැන්පතු ගිණුමේ සටහන් කර ඇති හඳුනා නොගත් තැන්පතු හඳුනා ගැනීමෙන් පසු අදාල ගිණුම් වලට බැර කිරීමත් හා පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු වසර 05 ක් තුල නිදහස් කරගෙන නොමැති නම් ඒවා මෙම ගිණුමට මාරු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| | (iii)මුදල් රෙගුලාසි 1646 | සමාලෝචිත වර්ෂයට අදාල විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන වාහන 24 ක මාසික සාරාංශයේ මුල් පිටපත ද, දෛනික ධාවන සටහන්වල මුල්පිටපත් ද ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී සියලුම රියදුරු මහතුන් තමන් අනුයුක්ත කර ඇති වාහනයට අදාල දෛනික ධාවන සටහන් මසක් අවසන් වී ඊ ලඟ මස මුල් සතිය ඇතුලත විෂය භාර ලිපිකරු වෙත භාරදීමට කටයුතු කරන මෙන් දැනුවත් කර ඇත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.1,874,019,805 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | මුළු විශ්වවිද්‍යාල පද්ධතිය තුළම සිදුවන්නේ මෙම ක්‍රමවේදය වන බැවින් මොරටුව විශ්වවිද්‍යාලය තුල ද එම ක්‍රමවේදය ක්‍රියාත්මක බව කාරුණිකව දන්වමි. | අදාල නීති,රීති අනුව කටයුතු කළ යුතුයි |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.13,245,551,250 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් පරිගණකගත ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යනු ලබයි. එහි මුද්‍රිත පිටපතක් ලබා ගැනීම සඳහා අධික පිරිවැයක් වැය වන බැවින් මුදල් අංශය සතු පරිගණකගත ස්ථාවර වත්කම් ලේඛණයට ප්‍රවේශ වී අදාල පරීක්ෂාවන් සිදු කල හැකි බව දන්වමි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර පරිගණකගත කරන ලද ස්ථාවර වත්කම් ලේඛණයට ප්‍රවේශවීමට විගණනයට ලබාදී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) සහ 4.2.1(ඇ) ඡේද | විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය ඇතුළත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැති අතර 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ද සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා ප්‍රසාම්පාදන සැලැස්ම පිළියෙල කර ඇති අතර එය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත | රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.165,349,451 ක් අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.388,530,483 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.553,879,934 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.310,000,000 කින් වැඩිවීම, රජයේ ප්‍රාග්ධන ප්‍රදාන (වියදම් කල) රු. 66,516,203 කින් වැඩිවීමත් ගිවිසුම්ගත සේවා සඳහා වියදම් රු. 36,529,828 කින් අඩුවීම හා අනෙකුත් මෙහෙයුම් වියදම් රු. 58,423,981 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1992 වර්ෂයේ සිට මොරටුව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කිසිදු ගිවිසුමකින් තොරව රජයේ බැංකු ශාඛාවක් හා රජයේ බැංකුවක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සවිකර තිබුණු අතර ඉන් කිසිදු කුලියක් 2022 මැයි මාසය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව බදු ගිවිසුම පිළියෙල කරමින් පවතී. | විධිමත් ගිවිසුම්වලට එළඹ යුතු අතර විශ්වවිද්‍යාලයට ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 33 දෙනෙකුගෙ ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබීම හේතුවෙන් 2021 | වසර 25 ක් ඉක්මවා තිබූ ආචාර්යවරුන් 09 දෙනෙකුගෙන් එක් අයෙකුට අයත් රු. 34,597.77 ක මුදලක් ඔහුට අයත් විශ්වවිද්‍යාල | අදාල මුදල් නිරවුල්කර ගැනීමට පියවර ගත යුතුයි. |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට එකතුව රු.55,348,324 ක් අයවිය යුතුව පැවති අතර ඉන් එකතුව රු.27,874,725 ක් වූ 21 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකල 1981 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව 2021 දෙසැම්බර් 31 දින වන විට කිසිදු මුදලක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අර්පසාධක අරමුදලින් පියවා ගැනීමටත් අනෙක් ආචාර්යවරුන් අට දෙනාගෙන් එක් අයකුගෙන් අය වීමට ඇති රු.703,311.12 ක මුදල පාලක සභාවේ තීරණය ප්‍රකාරව මුදල් රෙගුලාසි 109 (01) ට අනුව නොසලකා හැරීමට කටයුතු කරමින් පවතී. අනෙක් ආචාර්යවරුන් 07 දෙනාගෙන් අය විය යුතු මුදල් නීතිමය කටයුතු මගින් අය කර ගැනීමට කටයුතු කරනු ඇත. | |
| (ඇ)මොරටුව විශ්වවිද්‍යාලය මගින් විශ්වවිද්‍යාලයෙන් පරිභාහිර පාර්ශව වෙත ඉංජිනේරු උපදේශන සේවා සපයා සමාලෝචිත වර්ෂය තුළ රු.292,585,898 ක ආදායම් උත්පාදනය කර තිබියදී විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කෙරීගෙන යන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා බාහිර පාර්ශවයන්ගෙන් උපදේශන සේවා ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.7,359,395 ක් වැයකර තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත උපදේශන සේවා සැපයීමේ දී අදාල කාර්ය මණ්ඩලය විශ්ව විද්‍යාල රාජකාරීවලට අමතරව රාජකාරී වේලාවෙන් පරිබාහිරව මෙම සේවා සපයනු ලැබේ. විශ්ව විද්‍යාලයේ උපදේශන කාර්යයන් සඳහා අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීමට රජයේ මුදල් යෙදවිය නොහැකි බැවින් ආචාර්ය මණ්ඩලයට පැවරී ඇති රාජකාරීවලට පරිබාහිරව ඔවුන් විශ්ව විද්‍යාලයේ උපදේශන සේවා වලට යොදාගත නොහැක. | විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන්ගේ දැනුම විශ්වවිද්‍යායේ කාර්යයන් සඳහාද උපයෝගී කරගෙන වඩාත් වාසිදායක තීරණ ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) වර්ෂ 03 ක පමණ කාලයක සිට අක්‍රියව පවතින පාඨමාලා හා ව්‍යාපෘති ගිණුම් අදාල සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශය ලබාගෙන පියවා දැමීම විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය වුවද, වර්ෂ 04 ක කාලයක සිට එකතුව රු.3,270,874 ක්වූ අක්‍රියව පවතින ගිණුම් 04 ක් පියවා දැමීමට කටයුතු නොකර විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම ගිණුම් 04 අතුරින් එක් ගිණුමක් මේ වන විට පියවා ඇති අතර අනික් ගිණුම 03 ඉක්මණින් පියවා දැම්මට කටයුතු කරනු ලැබේ. | අක්‍රියව පවතින ගිණුම් පියවා දැමීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------------- | ----------- |
| (අ) 2017 සහ 2018 වර්ෂවල ආරම්භ කර තිබුණු හා 2021 දෙසැම්බර් | පර්යේෂණ 09 ක් සඳහා පර්යේෂණ කාල සීමාව දීර්ඝ | නියමිත කාලපරිච්ඡේදය තුල පර්යේෂණ නිම කිරීමට |

| | | |
|---|---|---|
| 31 දින වන විට නිම කළ යුතු දිනය ඉකුත්වී තිබුණු පර්යේෂණ 14 ක් සඳහා රු.17,135,136 ක් වැය කර තිබුණු නමුත්, 2021 දෙසැම්බර් 31 දින වන විට එම පර්යේෂණ නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | කර ඇත. පර්යේෂණ 12 ක් නිමකර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට රු.17,135,136 ක මුදලක් වැයකර තිබූ පර්යේෂණ 14 ක් තවමත් නිමකර නොමැත. | පියවර ගත යුතුයි. |
| (ආ) 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මිලදී ගෙන තිබූ එකතුව රු.2,775,690 ක් වූ ටෝනර් හා කාට්රේජ් (Toner & Cartridge) තොගයක් 2021 දෙසැම්බර් 31 දින වන විට ඌන උපයොජිතව පැවතුණි. | විශ්වවිද්‍යාලයට අවශ්‍ය ටෝනර් හා කාට්රේජ් මිලදි ගැනිමේ දී මෙලෙස අතිරික්තයන් ඇති නොවන පරිදි මිලදි ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන ඇත. | අවශ්‍යතාවය අනුව තොග මිලදී ගැනීම් සිදුකර අපතය අවම කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.9,624,111 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 22 ක් වර්ෂ 03 සිට වර්ෂ 11 ක කාලපරිච්ඡේදයක සිට කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීම සඳහා උපයෝජනය කර නොතිබුණි. තවද 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,356,683 ක් වූ අක්‍රිය තත්ත්වයේ පැවති ශිෂ්‍යත්ව අරමුදල් 22 ක් යොදාගෙන "සම්මාන හා ශිෂ්‍යත්ව" ලෙස නව ගිණුමක් ආරම්භකර තිබුණු නමුත් ඉන් ශිෂ්‍යත්ව පිරිනැමීමට නිර්ණායක සකස් කර නොතිබියදී තවත් රු.10,000,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් එම ගිණුමට මාරුකර තිබුණි. | මෙම අක්‍රිය තත්වයේ පවතින ශිෂ්‍යත්ව අරමුදල් සම්බන්ධයෙන් විස්තරාත්මකව සොයා බැලිම සඳහා සුභසාධක අංශයට සහ විභාග අංශයට උපදෙස් ලබා දී ඇත. එමෙන්ම මේ වන විට සම්මාන හා ශිෂ්‍යත්ව අරමුදලින් අවශ්‍යය ශිෂ්‍යත්වයන් ප්‍රදානය කිරීමට අවශ්‍යය නිර්නායකයන් සැකසිම සඳහා කමිටුවක් පත් කර ඇති අතර මේ වන විට මෙහි කටයුතු සිදුවෙමින් පවති. | අරමුදල් ඇතිකර ගැනීමේ අරමුණු වෙනුවෙන් එම අරමුදල් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.9,097,939 ක් වූ විශ්වවිද්‍යාලීය පාඨමාලා හා දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් 29 ක්, වර්ෂ 03 සිට වර්ෂ 04 දක්වා වූ කාලයක් තුළදී එම අරමුදල් පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් සඳහා මුදල් ලැබෙනුයේ අදාල දෙපාර්තමේන්තු විසින් ස්වයං ඉපයීම් පදනම මත සිදු කරනු ලබන විවිධ පාඨමාලා / පර්යේෂණ සහ උපදේශන සේවා මඟිනි. මෙම අරමුදල් නිශ්චිත කාලයක් තුළ වැය කළ | අරමුදල් ඇතිකර ගැනීමේ අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | යුතුවන බාහිර ආයතනයක් විසින් සපයන ලද අරමුදල් නොවන බැවින් ඒවා වර්ෂ කිහිපයක් වියදම් නොකර සංචිතයක් ලෙස තබා ගැනීමේ ගැටලුවක් නොමැති බව පෙනී යයි. <br> මෙම පාඨමාලාවන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් හා අනාගත අවශ්‍යතාවයන් වෙනුවෙන් සංචිතයක් ලෙස අදාල පාඨමාලා තුළින් උපයනු ලබන ආදායමින් කොටසක් මෙලෙස පාඨමාලා සංවර්ධන අරමුදල් ලෙස පවත්වා ගෙන යනු ලබයි. | |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිවෙලින් 1066 ක් හා 888 ක් වූ අතර තත්‍ය අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිවෙලින් 636 ක් හා 662 ක් වූයෙන් පුරප්පාඩු පිළිවෙලින් 430 ක් හා 226 ක් විය. අධ්‍යයන කාර්යමණ්ඩලයේ පවතින ආචාර්යවරුන්ගේ පුරප්පාඩු 228 වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.30,996,109 ක දීමනා ගෙවා තිබුණි. | අදාල තනතුර සඳහා සුදුසුකම්ලත් ඉල්ලුම්කරුවන් ඉල්ලුම්කර නොමැති වීමෙන් අදාල පුරප්පාඩු පිරවීමට නොහැකි වන අතර එවිට අධ්‍යන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීමට සිදුවේ | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගත යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක 12 දරන පොදු ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂයට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් අනුමත කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය ලේඛනයේ පිටපතක් 2022 අගෝස්තු 31 දක්වාම විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2022 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම මේ වන විට රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.<br><br>2022 සඳහා අයවැය ලේඛණ පිළියෙල කර ඇති අතර එය විගණනය සඳහා ඉදිරිපත් කල හැක. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |